විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අංක 4/2013(III)

මගේ අංකය - විවැ/චක්‍රලේඛ/2020
විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව,
මාලිගාවත්ත,
කොළඹ 10,
2021.01.12

සියලුම බැංකු සාමාන්‍යාධිකාරීවරුන් වෙත,

**විශ්‍රාමික ප්‍රජාවගේ ආර්ථික ප්‍රවර්ධනය සඳහා ණය පහසුකම් සැපයීම.**

උක්ත කරුණ සම්බන්ධයෙන් මවිසින් නිකුත් කර ඇති 2013.10.29 දිනැති විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අංක 4/2013, 2014.12.12 දිනැති විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අංක 4/2013(I) හා 2015.05.05 දිනැති විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අංක 4/2013(II) කෙරෙහි ඔබගේ කාරුණික අවධානය යොමුකරමි.

02. විශ්‍රාමිකයන්ගේ ජීවන තත්වය ඉහල නංවාලීමේ හා සක්‍රීය වැඩිහිටි ප්‍රජාවක් ලෙස සමාජ, ආර්ථික සංවර්ධනයටත්, ඔවුන් නැවත වරක් මෙරට ආර්ථිකය සවිමත් කිරීම සඳහා දායක කර ගැනීමත් පදනම් කර ගනිමින් රාජ්‍ය හා පෞද්ගලික බැංකු මගින් ක්‍රියාත්මක කරනු ලබන ණය යෝජනා ක්‍රමය මේ වන විට දිවයින පුරා සාර්ථකව ක්‍රියාත්මක වෙමින් පවතී.

03. රජය විසින් පවත්වාගෙන යනු ලබන ලිහිල් මූල්‍ය ප්‍රතිපත්තියට අනුකූලව බැංකු ණය පොලී අනුපාතය අඩුකර ඇති බැවින් විශ්‍රාමිකයන්හට එහි මූල්‍ය ප්‍රතිලාභ ලබා කර ගැනීම සඳහා මවිසින් නිකුත් කර ඇති 2015.05.05 දිනැති 4/2013(II) චක්‍රලේඛයෙහි 04 වන වගන්තිය, එනම් **"විශ්‍රාමිකයන් පෙර ණය මුදල අලුත්කර නැවත ණය මුදලක් ප්‍රදානය කිරීමේදී පෙර ණය මුදල ලබා ගත් දින සිට වර්ෂයක කාලයක් ගතවිය යුතුය"** යන්න විශ්‍රාමිකයන්ට සහන සැලසීම පමණක් අරමුණු කොට පහත කොන්දේසි වලට යටත්ව වෙනස් කිරීමට අනුමැතිය ලබා දෙමි.

i. විශ්‍රාමිකයන්ට දැනට ලබා දී ඇති ණය මුදලින් අයකර ඇති මුදල් ශේෂය පමණක් ඇතුලත් කර නව ණය පහසුකම යටතේ ලබා දිය යුතුය (රු.100,000 - රු.50,000 = රු.50,000).

ii. ණය ගෙවීමට ඇති කාලය දීර්ඝ නොකල යුතුය.

04. අනෙකුත් කරුණු සම්බන්ධයෙන් විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අංක 4/2013, 4/2013(I) හා 4/2013(II) හි සඳහන් විධිවිධාන එලෙසින්ම අදාල කර ගත යුතුය.

05. සමාජ ආරක්ෂණ ක්‍රමයක් වශයෙන් විශ්‍රාම වැටුප් ලබාදීමේ මූලික පරමාර්ථය විශ්‍රාමිකයාට තම විශ්‍රාමික ජීවිතය යහපත් ලෙස පවත්වාගෙන යාම වන බැවින් එයට බාධා නොවන ආකාරයට ණය මුදල් නිකුත් කිරීම හා වාරික අය කිරීම සිදු කරනු ඇතැයි අපේක්ෂා කරමි.

**ඒ.ජගත්.ඩී.ඩයස්**
විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්

පිටපත් - 01. ලේකම්, රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
02. ලේකම්, මුදල්, ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය
03. මහ බැංකු අධිපති, ශ්‍රී ලංකා මහ බැංකුව
04. විගණකාධිපති
05. සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන් හා ප්‍රාදේශීය ලේකම්වරුන්

} කරු.දැ.ගැ.ස